*සැ. යු.*- 2022.08.12 දින පළ වූ අංක 2,293 දරන *ගැසට් පත්‍රයේ* IV (අ) කොටස පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,294 - 2022 අගෝස්තු මස 19 වැනි සිකුරාදා - 2022.08.19**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)

## II කොටස – අධිකරණ

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙන පිටු අංක යොදා ඇත.)


| | පිටුව |
|---|---|
| සම්මත වූ පනත් ... ... ... ... | — |
| පනත් කෙටුම්පත් ... ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ දැන්වීම් ... ... ... ... | — |
| ශ්‍රී ලංකා ඇපැල් උසාවියේ දැන්වීම් ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ අපරාධ නඩු සැසි පිළිබඳ නිවේදන ... | — |
| දිසා අධිකරණ හා මහෙස්ත්‍රාත් අධිකරණ දැන්වීම් ... | — |
| වස්තු භංගත්ව නඩු පිළිබඳ දැන්වීම් ... ... ... | — |
| පිස්කල් මාර්ෂල්වරුන්ගේ පත් කිරීම් ... ... ... | — |
| පිස්කල් විකිණීම් ... ... ... | 570 |
| බූදල් නඩු පිළිබඳ දැන්වීම් ... ... ... ... | — |
| නීති අධ්‍යාපන සභාවේ දැන්වීම් ... ... ... | — |
| නොතාරිස් ලැයිස්තු ... ... ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... ... | 571 |


*සැ. යු.* -(i) අධිකරණ සංවිධාන (සංශෝධන) පනත් කෙටුම්පත 2022 අගෝස්තු මස 05 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පලකරන ලදි.

(ii) සිවිල් නඩු විධාන සංග්‍රහය (සංශෝධන) පනත් කෙටුම්පත 2022 අගෝස්තු මස 05 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පලකරන ලදි.

(iii) පළාත්බද මහාධිකරණ (විශේෂ විධිවිධාන) (සංශෝධන) පනත් කෙටුම්පත 2022 අගෝස්තු මස 05 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පලකරන ලදි.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

**වැදගත් නිවේදනයයි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළකරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාලවේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර (එනම්, 2022 සැප්තැම්බර් මස 09 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2022 අගෝස්තු මස 26 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර) තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

**"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් *ගැසට් පත්‍රයේ* පළකළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට් පත්‍රයක* පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැළකිය යුතු ය."**

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2022 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම *ගැසට් පත්‍රය* www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

# පිස්කල් විකිණීම්

## පිස්කල් වෙන්දේසියේ විකිණීමයි

හැටන් දිසා අධිකරණයේ දී ය

මහනුවර, කටුගස්තොට පාර, අංකඃ 187 හි ප්‍රධාන කාර්යාලය පවත්වාගෙන යන සෙරන්ඩිබ් ෆිනෑන්ස් ලිමිටඩ්

මහනුවර දිසා අධිකරණයේ
නඩු අංකය : DMB 00085/18
හැටන් දිසා අධිකරණයේ
ඇස්කිසි අංකය

....................පැමිණිලිකාර සමාගම.

*එදිරිව*

01. බාලසුබ්‍රමනියම් විජයන්දන්
අංක 26, දුම්රියපොළ පාර,
කොටගල.

02. සුබ්‍රමනියම් ගුණරත්නම්
අංක 136, කෙලින් වීදිය,
කොටගල.

............................විත්තිකරුවන්.

වර්ෂ 2020 ක්වූ අගෝස්තු මස 21 වැනි දින දරන මහනුවර දිසා අධිකරණයේ ඉහත අංක සඳහන් නඩුවේ නඩු තීන්දුව ප්‍රකාර එකී නඩුවේ ඉහත කී 01 වන 02 වන විත්තිකරුවන්ගෙන් පැමිණිලිකාර සමාගමට අයවීමට ඇති රුපියල් විසි නව ලක්ෂ විසි හත් දහස් එකසිය හතළිස් හතයි ශත අනූ දෙක (රු. 2,927,147.92) ක මුදලින් රුපියල් ලක්ෂ විස්සක (රු. 2,000,000.00) මුදල අඩුකොට ඉතිරි රුපියල් නව ලක්ෂ විසි හත් දහස් එකසිය හතළිස් හතයි ශත අනූ දෙක (රු. 9,27,147.92) අයකර ගැනීම සඳහා පැමිණිල්ලේ ආයාචනයේ සහ විකිණීමේ අධිකාරි පත්‍රයේ සඳහන් ආ, ඇ, ඈ, ඉ, ඊ හා උ ඡේදයන් හි සහනයක් ද ලබාගැනීම සඳහා ආඥා කොට ඇති බැවින් ද,

ඉහත කී රුපියල් නව ලක්ෂ විසි හත් දහස් එකසිය හතළිස් හතයි ශත අනූ දෙක (රු. 9,27,147.92) ක මුදල සහ පැමිණිල්ලේ ආයාචනයේ සහ විකිණීමේ අධිකාරි පත්‍රයේ සඳහන් ආ, ඇ, ඈ, ඉ, ඊ හා උ ඡේදයන්හි සහනයන් ද ලබාගැනීම සඳහා මෙහි පහත උපලේඛනයෙහි සවිස්තරව දක්වා ඇති දේපළට අයත් සියලුම අයිතිවාසිකම්, පරවශතා සහ අනුබද්ධිතයින් ද විත්තිකරුවන්ගෙන් කවර ආකාරයෙන් හෝ සියලු අයිතිවාසිකම් හිමිකම් බලපුළුවන්කාරකම් හිමිකම්පෑම් සහ ඉල්ලීම් ද මෙහි පහත උපලේඛනයේ හා පැමිණිල්ලේ උපලේඛනයෙහි සඳහන් දේපළෙන් උපදන සහ එකතුවන සියලු කුළී ලාභ සහ අනෙකුත් ආදායම්ද සියළු ගිවිසුම් සහ රක්ෂණ ගිවිසුම්ද ඇතුළුව මෙහි පහත උපලේඛනයේ සවිස්තරව දක්වා ඇති එකී දේපළ නිශ්චිතව බැඳී ඇති බවට හා ඇස්කිසි කලහැකි බවට ප්‍රකාශ කරන ලද හෙයින් ද අධිකරණයෙන් නියම කරන ලද කොන්දේසිවලට යටත්ව පහත උපලේඛනයේ විස්තර කර ඇති දේපළ, වර්ෂ **2022.09.22 වැනි දින ප.ව 01.00**ට එම දේපල පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණන්නට යෙදෙන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

### උපලේඛනය

01. මධ්‍යම පළාතේ, නුවරඑළිය දිස්ත්‍රික්කයේ, නුවරඑළිය දිඹුල්ල කෝරළේ, නුවරඑළිය ප්‍රාදේශීය සභා සීමාව තුළ නුවරඑළිය ප්‍රාදේශීය ලේකම් සීමාවේ අංක 475 කොටගල ග්‍රාම නිළධාරි සීමාවේ කොටගල පිහිටා තිබෙන වෝට්ටන් එස්ටේට් (වූටන් වත්ත කොටසක්) නැමැති ඉඩමට වර්ෂ 1996 නොවැම්බර් මස 30 වැනි දින ඩබ්ලිව් ඒ. කේ. එන්. වික්‍රමසිංහ අවසරලත් මිනින්දෝරු තැන විසින් මැන සාදන ලද අංක 1273 දරන පිඹුරේ කැබලි අංක 01 දරන කොටසට මායිම්:- උතුරටඃ වර්ෂ 1969 මාර්තු මස 29 වැනි දින අවසරලත් මිනින්දෝරු ජේ. ටී. ඩේවිඩ් මහතා අංක 4523 සී සහ 4523 එච් දරන ඉඩම් පිඹුරු ද නැගෙනහිරට, කැබලි අංක 02 ද, දකුණට : අවසරලත් මිනින්දෝරු සී. පත්මනාතන් මහතාගේ අංක 168/91 දරන පිඹුර ද බස්නාහිරට : අංක 1273 දරන පිඹුරේ නිරූපිත වතු පාර ද යන මායිම් තුළ පිහිටි පර්චස් පහයි දශම පහයි බින්දුව (පර්ඃ 5.50) *හෙවත්* හෙක්ටයාර් 0.0139 ක් විශාල ඉඩම සහ ඒ තුළ පිහිටි සෑම සියලු දේද වේ. මෙය නුවරඑළිය ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ අංකඃ A171/68 දරන පත්ඉරුවේ ලියාපදිංචි වී ඇත.

02. මධ්‍යම පළාතේ, නුවරඑළිය දිස්ත්‍රික්කයේ, නුවරඑළිය දිඹුල්ල කෝරළේ, නුවරඑළිය ප්‍රාදේශිය සභා සීමාව තුළ නුවරඑළිය ප්‍රාදේශීය ලේකම් සීමාවේ අංක 475 කොටගල ග්‍රාම නිළධාරි සීමාවේ කොටගල පිහිටා තිබෙන වෝට්ටන් එස්ටේට් (වූටන් වත්ත - කොටසක්) නැමැති ඉඩමට වර්ෂ 1996 නොවැම්බර් මස 30 වැනි දින ඩබ්ලිව්. ඒ. කේ. එන්. වික්‍රමසිංහ අවසරලත් මිනින්දෝරු තැන විසින් මැන සාදන ලද අංක 1273 දරන පිඹුරේ කැබලි අංක 02 දරන කොටසට මායිම් උතුරට : වර්ෂ 1969 මාර්තු මස 29 වැනි දින අවසරලත් මිනින්දෝරු ජේ. ටී. ඩේවිඩ් මහතා අංක 4523 එච් දරන පිඹුර සහ වර්ෂ 1962.01.05 දින අවසරලත් මිනින්දෝරු එම්. එල්. තීර්ථවේලු මහතාගේ අංක 1787 දරන පිඹුරේ කැබලි අංක 09 ද නැගෙනහිරට : අංක 1787 දරන පිඹුරේ කැබලි අංක 09 ද දකුණට : අංකඃ 4523 එච් දරන පිඹුරේ සඳහන් ඉතිරි කැබැල්ල ද බස්නාහිරට : අංක : 1273 දරන පිඹුරේ නිරූපිත කැබලි අංක : 01 ද යන මායිම් තුළ පිහිටි පර්චස් බින්දුවයි දශම තුනයි හයක් (පර්ඃ 0.36) *හෙවත්* හෙක්ටයාර් 0.0139 ක් විශාල ඉඩම සහ ඒ තුළ පිහිටි ගොඩනැගිලි ආදී සෑම සියලු දේද වේ. මෙය නුවරඑළිය ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ අංකඃ A 171/69 දරන පත්‍රිරුවේ ලියාපදිංචි වී ඇත.

බී. ජී. අයි. පී. එම්. සේනානන්ද,  
රෙජිස්ට්‍රාර්/නියෝජ්‍ය පිස්කල්,  
දිසා අධිකරණය - හැටන්.

වර්ෂ 2022ක් වූ අගෝස්තු මස 02 වැනි දින දී ය.

08-118

---

# විවිධ දැන්වීම්

## ස්වකීය සිවිල් අධිකරණ බලය ක්‍රියාත්මක කරමින් කොළඹදී රැස්වෙන බස්නාහිර පළාතේ මහාධිකරණ ඉදිරිපිටදී ය

නොතීසිය

නඩු අංකය : CHC/32/2022/CO  
ස්වභාවය : සමාගම් ඈවර කිරීම

මල්වාන, බියගම අපනයන පිරිසැකසුම් කලාපයේ (BEPZ) ලොට් අංක 15 හි පිහිටි ලූමියර් ටෙක්ස්ටයිල්ස් ලිමිටඩ් සම්බන්ධ කාරණයේදී ය.

*සහ*

2007 අංක 07 දරන සමාගම් පනතේ 270 (ඉ) වගන්තිය සමග කියවෙන 534 වගන්තිය යටතේ අධිකරණය විසින් ලූමියර් ටෙක්ස්ටයිල්ස් ලිමිටඩ් හි කටයුතු ඈවර කිරීම සඳහා කරනු ලබන ඉල්ලීම පිළිබඳ කාරණයේදී ය

සෙබෙක් ඉන්ටර්නැෂනල් (ප්‍රයිවට්) ලිමිටඩ්  
Xebec International PTE Limited  
#12-05, ද බෙන්කූලන් වීදිය,  
සිංගප්පූරුව (189648)  
#12-05, The Bencoolen Street,  
Singapore (189648).

......................*පෙත්සම්කරු.*

බස්නාහිර පළාතේ, වාණිජ මහාධිකරණය විසින් ඉහත නම් සඳහන් සමාගම ගණන් බේරා වසා දැමීම පිණිස පෙත්සමක්, 2022 ක් වූ ජූලි මස 28 වැනි දින එකී අධිකරණය වෙත පෙත්සම්කරු වෙනුවෙන් නීතිඥ රසිකා වෙල්ලප්පිලි විසින් ඉදිරිපත් කර ඇති බව ද, එකී පෙත්සම 2022 ක් වූ ඔක්තෝබර් මස 10 වැනි දින අධිකරණය ඉදිරියෙහි විභාග කරනු ලැබීමට නියම කර ඇති බවද එකී පෙත්සම

මත නියෝගයක් කිරීම තහවුරු කිරීමට හෝ ඊට විරුද්ධ වීමට හෝ කැමති එකී සමාගමේ කිසියම් ණය හිමියෙකු හෝ සහදායකයකු වේ නම් ඒ තැනැත්තාට තත්කාර්ය සඳහා එය විභාග කරන අවස්ථාවෙහි පෞද්ගලිකව හෝ තමාගේ නීතිඥවරයා මාර්ගයෙන් හෝ පෙනී සිටිය හැකි බවද, පෙත්සමේ පිටපතක් අවශ්‍ය වන එකී සමාගමේ ඕනෑම ණය හිමියෙකුට හෝ සහදායකයකුට ඒ සඳහා නියමිත ගාස්තුව ගෙවූ විට පහත සඳහන් අය විසින් සපයනු ලබන බවද, මෙයින් දැනුම් දෙනු ලැබේ.

රසිකා වෙල්ලප්පිලි
පෙත්සම්කරුගේ නීතිඥ
අංක. 25/1/B, බෙල්මන්ට් වීදිය, කොළඹ 12.

*සටහන.* - එකී පෙත්සම විභාග කරන අවස්ථාවෙහි පෙනී සිටීමට කැමති ඕනෑම තැනැත්තෙකු විසින් තමා එසේ කිරීමට අදහස් කරන බවට ලිඛිත දැන්වීමක් නීතිඥ රසිකා වෙල්ලප්පිලි වෙත භාරදිය යුතුය. *නැතහොත්* තැපෑලෙන් එවිය යුතුය. එම දැන්වීමෙහි එම තැනැත්තාගේ නම සහ ලිපිනයද, ව්‍යාපාර ආයතනයක් නම් ව්‍යාපාර ආයතනයේ නම සහ ලිපිනයද සඳහන් කළ යුතු අතර, එය එම තැනැත්තා හෝ ව්‍යාපාර ආයතනය විසින් හෝ ඔහුගේ හෝ ඔවුන්ගේ (නීතිඥවරයෙකු වෙතොත්) එම නීතිඥවරයා විසින් අත්සන් කළ යුතුවාක් මෙන්ම 2022 ක්වූ ඔක්තෝබර් මස 09 වැනි දින සවස 6.00 ට පෙර ලැබෙන ලෙස භාරදිය යුතුය. *නැතහොත්* තැපෑලෙන් එවන්නේ නම් එදින එකී වේලාවට පෙර ලැබෙන ලෙස කල්වේලා ඇතිව තැපැල් කළ යුතුය.

08-145

---

**සුසරණ ලංකා පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි**

අසංක නවරත්න වන මම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝගවල අංක 53 (1) දරන ස්ථාවර නියෝගය යටතේ සුසරණ ලංකා පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි" යනුවෙන් හැඳින්වෙන පනත් කෙටුම්පතක් පාර්ලිමේන්තුවේ දී ඉදිරිපත් කිරීමට අදහස් කරන බව මෙයින් දැනුම් දෙමි.

පනත් කෙටුම්පතේ අරමුණු වනුයේ පහත සඳහන් පොදු පරමාර්ථවලින් යුක්ත වන්නා වූ එකී පදනම සංස්ථාගත කිරීමයි:-

01. අඩු ආදායම්ලාභී දරුවන් ඉලක්ක කොට ගෙන අධ්‍යාපන ශිෂ්‍යත්ව, පාසල් උපකරණ ලබාදීම මෙන්ම අනෙකුත් ආධාර හා උපකාරක සේවා ක්‍රියාත්මක කිරීම.

02. විදේශ අධ්‍යාපන ආයතන සමග සම්බන්ධීකරණය කරමින් මෙරට දරුවන්ට විවිධ ක්ෂේත්‍රයන් ඔස්සේ ජාත්‍යන්තර මට්ටමේ දැනුම සහ අත්දැකීම් ලබා දීම සහ එම රටවල් සමග දැනුම් හුවමාරු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

03. දුෂ්කර පාසල්වල පුස්තකාල පහසුකම් වැඩිදියුණු කිරීම සහ දරුවන් කියවීමට යොමු කිරීම අරමුණු කොට ගෙන එම පාසල් වලට අවශ්‍ය පොත්පත් සහ අනෙකුත් භෞතික පහසුකම් ලබා දීම, සාහිත්‍ය නිර්මාණ තරග හා වෙනත් නිර්මාණශීලී වැඩසටහන් සංවිධානය කිරීම.

04. අනාගත දේශීය හා විදේශීය රැකියා වෙළඳපොළට ගැළපෙන ලෙස දරුවන් තුළ ව්‍යවසායක ගුණාංග හා නිපුණතා සංවර්ධනය කිරීමට අදාළව ඒ ඒ ක්ෂේත්‍රවල ප්‍රවීණයන් මගින් පාසල් දරුවන්ට පුහුණු වැඩසටහන් හා අත්දැකීම් ලබා දීම යනාදිය වේ.

..............................................................

අසංක නවරත්න,
පාර්ලිමේන්තු මන්ත්‍රී,
කුරුණෑගල දිස්ත්‍රික්කය.

08-153

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.